## මුද්දර ලෝකය




# කුරුලු සංචාරකයෝ

**අනුර සමරවීර**

මහ පොළවේ ජීවත්වන සතුන් අතුරින් කුරුලු පරපුර පිළිබඳව බොහෝ අතීතයේ සිට මිනිසාගේ වැඩි අවධානයක් පැවතිණි. අහස තරණය කිරීම සඳහා වූ පාඩම මිනිසා අධ්‍යයනය කරනු ලැබුවේද කුරුල්ලන් ගෙනි.

කෙසේ නමුත් මේ වන විට මිනිසා විසින්ම නිර්මාණය කරන ලද නොයෙකුත් පාරිසරික ගැටලු හමුවේ කුරුලු පරපුරෙහි පැවැත්මට ඇති කර ඇති අභියෝග සුළුපටු නොවේ.

අපේ ලොවේ මේ වන විට කුරුලු විශේෂ 8000 කට වැඩි ප්‍රමාණයක් ජීවත් වන බවට විශ්වාස කෙරෙයි. ලොව කුඩාම කුරුල්ලා ලෙස සැලකෙන 'හම්ං බර්ඩ්' වර්ගයේ 'බී හම්ං' කුරුල්ලන්ගේ සිට විශාලතම කුරුල්ලා වන 'පැස්බරා' දක්වා විවිධ ගති පැවතුම් ඇති වෛවර්ණ කුරුල්ලන් වර්ග අති විශාල සංඛ්‍යාවක් කුරුලු ලෝකයේ නිර්මාණය වී තිබේ.

මේ කුරුල්ලන් වැඩි ප්‍රමාණයක් තම ජීවිත පැවැත්මට උරුමකම් ඇති ප්‍රදේශවල ජීවත් වෙයි. ඒ අතරින් එක් එක් රටවලට පමණක් සීමා වූ ආවේනික කුරුල්ලන් පිළිබඳව වැඩි

# උත්තර ධ්‍රැවයේ රටවල සිට පැමිණෙන සංක්‍රමණික කුරුල්ලන් ආපසු තම උපන් බිමට යාම පිළිබඳව විවිධ මත පවතී. ඉන් වඩාත්ම තහවුරු වී ඇති අදහස වන්නේ මේ කුරුල්ලන්ට තම පැටවුන් හොඳට හද වඩා ගැනීම සඳහා උත්තර ධ්‍රැවයේ පරිසරයට වැඩි කැමැත්තක් දැක්වීමයි.

අවධානයක් යොමු කිරීම ඉතාම වැදගත් වන්නේ එසේ නොකිරීමෙන් ඔවුන් සදහටම මෙලොවින් තුරන් වී යාමේ අභියෝගයට මුහුණ දී ඇති බැවිනි.

සංක්‍රමණික කුරුල්ලන් පිළිබඳව ද මිනිසා තුළ යම් අවධානයක් පවතී. ලොවේ එක් ප්‍රදේශයක සිට තවත් ඈත පෙදෙසකට පියඹා යන මේ කුරුල්ලන් සිදු කරන මෙම සංක්‍රමණය 'කුරුලු පර්යටනය' නමින් හඳුන්වයි. තමන් ජීවත්වන පරිසරයේ ඇතිවන දේශගුණික වලින් මිදීම සඳහා මෙම කුරුල්ලන් රටින් රට සංක්‍රමණය වන බව සනාථ වී තිබේ.

සීත සෘතුවේදී උත්තර ධ්‍රැවයේ රටවල ජීවත්වන කුරුල්ලන්ට විඳීමට සිදුවන දැඩි ශීතලින් මිදීමටත් අවශ්‍ය උෂ්ණත්වය පහසුවෙන් සලසා ගැනීමටත් මෙම ක්‍රියාවලියෙන් හැකියාව ලැබේ. ශීත සෘතුවේදී පවතින කෙටි දිවා කාලය මග හැර ගැනීමට හැකි වීමෙන් ආහාර සොයා ගැනීමට ඇති කාලය වැඩි වීමද අමතර වාසියකි.

කුරුලු පර්යටනය පිළිබඳව මිනිසා තුළ බොහෝ කලක පටන් යම් අවබෝධයක් පැවති ඇති බවට විශ්වාස කිරීමට පුළුවන. පැරණි ජන වහරින් හා වංශ කථා ආදියෙන් ඊට සාක්ෂි සැපයෙයි.

කෙසේ වෙතත් මේ පිළිබඳව වැඩි අවධානයක් යොමුවී ඇත්තේ වසර 200 ක පමණ අතීතයේ සිට බව පෙනී යයි.

සංක්‍රමණික කුරුල්ලන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳව ක්‍රමවත් ලෙස නිරීක්ෂණය කිරීමට වැඩ පිළිවෙළක් ගොඩනැඟීමට පරිසර විද්‍යාඥයන් විසින් කටයුතු කර ඇත්තේ මෙම වකවානුවේදීය. මෙවන් සංක්‍රමණ සිදුවන බව තහවුරු කර ගැනීම සඳහා මෙන් ම විවිධ පර්යේෂණ සඳහා පක්ෂීන්ට සංකේත හා මුදු පැළඳවීම වැනි උපක්‍රම යොද ගැනීම ඇරඹුයේ එම කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙනි.

මෙවන් පර්යටන කුරුල්ලන්ගේ සංක්‍රමික ක්‍රියාවලිය පහත අයුරින් කොටස් කර දක්විය හැක.

01. ඉලක්ක ස්ථාන කරා පියාසර කිරීම.

02. ඒ සඳහා යම් නිශ්චිත ගමන් මාර්ගයක් උපයෝගී කර ගැනීම.

03. එම මාර්ග ඔස්සේම ආපසු ගමන.

04. වාර්ෂිකව අඛණ්ඩව මෙම ක්‍රියාවලිය සිදුවීම.

පර්යටන පක්ෂීන්ගේ මෙම විස්මිත සංචාරය 'ද්වි දිසා ගමන' යන නමින් ද හඳුන්වයි. එනම් ශීත කාලයේදී ආහාර සපයා ගැනීමට එක් ප්‍රදේශයකට පැමිණීමත් වසන්ත කාලයේ දී තම පැටවුන් බිහි කිරීම සඳහා තම නිජබිම සොයා යාමත් වේ.

කුරුලු පර්යටනය වැඩි වශයෙන් සිදුවන්නේ රාත්‍රී කාලයේ දී බව සොයා ගෙන තිබේ.

එනම් සඳ තරු නැතහොත් හිරු සහාය කර ගනිමින් මෙම සංචාරයන් සිදුකරන බවද විශ්වාස කෙරෙයි. මෙවැනි කුරුල්ලෝ බොහෝ විට අඩි 4000 පමණ ඉහළින් පියාසර කරති. සමහර කුරුල්ලන් කඩින් කඩ නැවති සැතපුම් 500 ක් පමණ දිනකට පියාසර කරන අතර එක දිගට සැතපුම් 2000 ක් පමණ පියාසර කරන පක්ෂහු ද සිටිති. උත්තර ධ්‍රැවයේ රටවල සිට පැමිණෙන සංක්‍රමණික කුරුල්ලන් ආපසු තම උපන් බිමට යාම පිළිබඳව විවිධ මත පවතී. ඉන් වඩාත්ම තහවුරු වී ඇති අදහස වන්නේ මේ කුරුල්ලන්ට තම පැටවුන් හොඳට හද වඩා ගැනීම සඳහා උත්තර ධ්‍රැවයේ පරිසරයට වැඩි කැමැත්තක් දක්වීමයි. එසේම එම රටවල ශීත කාලයෙන් පසු රාත්‍රී කාලය කෙටි වෙයි. දිගු දිවා කාලය තුළ වැඩි වේලාවක් පැටවුන්ට ආහාර සොයා ගැනීමට හැකිවීම ද ඊටම ගැලපෙන සාධකයකි.

ශ්‍රී ලංකාව ද කුරුලු පරාදීසයකි. අගෝස්තු මාසයෙන් පසු එළඹෙන සමය තුළදී විවිධ වර්ග වලට අයත් සංචාරක කුරුල්ලන් අප රට තුළ සැරිසරනු දක්නට ලැබෙයි. විශේෂයෙන් 'කුමන' වැනි කුරුලු අභයභූමි මෙවැනි වකවානුවකදී කුරුලු විශේෂ වලින් පිරී යයි.

ඈත අපරදිගින් මෙන්ම හිමාල ප්‍රදේශයේ සිට අප රටට සංක්‍රමනය වන කුරුල්ලන් ප්‍රධාන වශයෙන් ගමන් මාර්ග දෙකක් යොද ගනී. ඉන් එකක් ඉන්දියාවේ සිට පේදුරුතුඩුව හරහා වැටී ඇති නැගෙනහිර මාර්ගයයි. අනෙක බටහිර වෙරළ ඔස්සේ රටතුළට පැමිණීමයි. හිමාල අඩවියේ සිට මෙරටට පැමිණෙන සුදු රෙදි හොරා, අව්ච්චියා වැනි පක්ෂීන් යොද ගන්නේ පළමු මාර්ගයයි.

# ඈත අපරදිගින් මෙන්ම හිමාල ප්‍රදේශයේ සිට අප රටට සංක්‍රමනය වන කුරුල්ලන් ප්‍රධාන වශයෙන් ගමන් මාර්ග දෙකක් යොද ගනී. ඉන් එකක් ඉන්දියාවේ සිට පේදුරුතුඩුව හරහා වැටී ඇති නැගෙනහිර මාර්ගයයි. අනෙක බටහිර වෙරළ ඔස්සේ රටතුළට පැමිණීමයි. හිමාල අඩවියේ සිට මෙරටට පැමිණෙන සුදු රෙදි හොරා, අව්ච්චියා වැනි පක්ෂීන් යොද ගන්නේ පළමු මාර්ගයයි.

කුරුලු පර්යටනය පිළිබඳව පර්යේෂණ කරන විද්‍යාඥයන් විසින් සංකේත හා මුදු පැළඳවීම මඟින් මෙවැනි කුරුල්ලන් පිළිබඳව නිරන්තරයෙන් පරීක්ෂාවන් සිදු කරයි. මේ සඳහා යොද ගන්නා ලෝහමය මුදුවල කුරුල්ලන් හඳුනා ගැනීමට හැකි අනුක්‍රමික අංකයක් හා ඌ නැවත යමෙකුට හමුවුවහොත් ඒ බව දන්වා යැවිය යුතු පර්යේෂකයන්ගේ ලිපිනය ආදිය සඳහන් වේ.

මෙසේ මුදු ලෑම සඳහා කුරුල්ලන් ඇල්ලීම ඉතා භාරදූර කාර්යයකි.මේ සඳහා ඉතා සියුම් දැල් විශේෂයක් යොදගනී. පියාසර කරන කුරුල්ලෝ මේ නොපෙනෙන දැල්වල පැටලී ඊට අමුනා ඇති මලුවලට වැටෙයි. එසේ අල්ලා ගන්නා උන්ගේ බර කිරා සටහන් කරගනු ලැබේ.

බර කිරීම සඳහා කළු පැහැති මල්ලක් ප්‍රයෝජනයට ගැනීම මඟින් උගේ දඟලීම පාලනය කිරීම ද වැදගත් කරුණකි. පසුව මුදු හරින මෙම කුරුල්ලන්ගේ සංචාරක කාලය අනුව විවිධ නිගමනවලට පැමිණීමට කුරුලු විද්‍යාඥයන්ට හැකියාව තිබේ.

මුද්දර ලෝකය ද කුරුලු මුද්දර වලින් අලංකාර වී තිබේ. කෙසේ වෙතත් ලොවේ බොහෝ රටවලින් නිකුත්කර ඇත්තේ ඒ ඒ රටවලට ආවේණික කුරුලු වර්ග සඳහා පමණකි.

ශ්‍රී ලංකාව ද අපේ රටට ආවේණික කුරුලු වර්ග රැසක් මුද්දරයට නගා තිබේ.

කෙසේ වුවද වෙනත් රටවලින් සංචාරක කුරුලු විශේෂ පිළිබඳව දර්ශනීය මුද්දර සීමිත ප්‍රමාණයක් වුවද මුද්දරයට නගා තිබීම සතුටට කරුණකි. ❑